# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1419 / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2023

දිනය
திகதி
Date — 13/11/2023
පැය 1300

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2023.11.13 වන අද දින පැවැත්වීමට නියමිත 2024 පාර්ලිමේන්තු අයවැය ඉලක්ක කර ගනිමින් 2024 වර්ෂයට අදාලව අයවැයෙන් සියළුම රාජ්‍ය සේවක වැටුප් වැඩි කරන ලෙස ඉල්ලා දේශපාලන පක්ෂයකට සම්බන්ධ වෘත්තිය සමිති නියෝජනය කරමින් සාමාජිකයන් පිරිසක් විසින් වැලිකඩ පොලිස් වසමේ විරෝධතාවයක් පැවැත්වීමට සැලසුම් කර ඇති බවට වැලිකඩ පොලිස් ස්ථානාධිපතිට තොරතුරු ලැබී තිබුණි.

ඒ අනුව ඔහු විසින් ඒ සම්බන්ධව ගරු අධිකරණයේ අවධානය යොමුකර පොල්දූව හංදියේ සිට පාර්ලිමේන්තුවට පිවිසීමට ඇති ජයන්තිපුර පාර්ලිමේන්තුවේ ප්‍රධාන දොරටුව දක්වා ප්‍රධාන මාර්ගය අවහිරයකින් තොරව පවත්වාගෙන යාමට ද, පොල්දූව හංදියේ සහ අවට ප්‍රදේශවල මෙම විරෝධතාවය ප්‍රචණ්ඩකාරී ස්වරූපයකින් තොරව පවත්වාගෙන යන ලෙසටද, වැලිකඩ පොලිස් වසම, පොල්දූව වටරවුම සහ පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ගය අවට පිහිටි කිසිඳු රාජ්‍ය ආයතනයට, නිල නිවසකට, දේපලකට හෝ පෞද්ගලික නිවාසයකට ඇතුල් වීම, හානි කිරීම හා එම ප්‍රදේශයේ රාජකාරී කරන නිලධාරීන්ට රාජකාරීන් වලට බාධා වන අයුරින් කිසිඳු ප්‍රචණ්ඩකාරී සහ නීති විරෝධී ක්‍රියාකාරකම් වල නොයෙදෙන ලෙසට 2023.11.13 වන දින පැය 1230 ට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති 2024 වර්ෂයට අදාල අයවැය සඳහා පැමිණෙන සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ එම කාර්ය මණ්ඩලයට එම සැසිවාර වලට සහ රාජකාරී වලට පැමිණීමට සහ පිටවයාමට භාවිතා කරනු ලබන පාර්ලිමේන්තු පිවිසුම් මාර්ග අවහිර නොකරන ලෙසටත් මෙම දිනය සතියේ දිනයක් බැවින් පාර්ලිමේන්තුවට ඇතුල් වන ජයන්තිපුර ප්‍රධාන මාර්ගය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මාර්ගය භාවිතා කරන සාමාන්‍ය මහජනතාවට එදිනෙදා තම දෛනික කාර්යයන් බාධාවකින් තොරව ඉටුකර ගැනීම සඳහා එම මාර්ග වල පහසුවෙන් ගමන් කිරීමට බාධාවක් නොවන ආකාරයට, විරෝධතා පවත්වන ලෙසටත්, උද්ඝෝෂණකරුවන් හා මහජනතාව අතර ගැටුම්කාරී තත්ත්වයක් හා නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වී මහජන පීඩාවක් ඇති විය හැකි බැවින්, මහජන පීඩාවක් ඇතිවීම වළක්වාලීමට හා මහජන ආරක්ෂාව වෙනුවෙන් වග උත්තරකාර පාර්ශවයන්ට, ඔවුන්ගේ අනුගාමිකයන්ට හා වෙනත් නායකයින්ට ප්‍රචාණ්ඩකාරී හා කලහකාරී ක්‍රියාවන් වලක්වාලමින් පහත සඳහන් පාර්ශවකරුවන් වෙත ආඥාවක් නිකුත් කරන ලෙසට කොළඹ ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කර ඇත.

පාර්ශවකරුවන් -

01. ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ කැඳවුම්කරු, වසන්ත සමරසිංහ
02. ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ ලේකම්, චන්දන සූරිආරච්චි,
03. ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම්, රංජන් ජයලාල්,
04. සමස්ථ ලංකා වරාය පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම්, නිරෝෂන් ගොරකානගේ,
05. දුම්රිය වෘත්තිය සමිති පෙරමුණේ සභාපති, ඩී.එම්.ඩී අබේරත්න,
06. රාජ්‍ය කළමණාකරණ සහකාර නිළධාරි සංගමයේ සභාපති, උදේනි දිසානායක,
07. විශ්‍රාමිකයින්ගේ හිමිකම් සුරකීමේ සංගමයේ ප්‍රධාන ලේකම්, සරත්ලාල් පෙරේරා,
08. ශ්‍රී ලංකා එක්සත් ග්‍රාමනිළධාරීන්ගේ සංගමයේ සභාපති, කමල් කිත්සිරි,
09. ලංකා ගුරුසේවා සංගමයේ සභාපති, ධම්මික අලහපෙරුම,
10. රාජ්‍ය සේවා ජාතික සේවා සංවර්ධන නිළධාරීන්ගේ සංගමයේ ලේකම්, බී.ඒ.බී බස්නායක,
11. රාජ්‍ය කළමණාකරණ සේවා නිළධාරී සංගමයේ සභාපති, කේ.ජී.එස් නයනජිති,
12. සමස්ථ ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම්, එස්.පී විතානගේ,
13. සමස්ථ ලංකා ලංචිම පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම්, සේපාල ලියනගේ, සහ වෙනත් තැනැත්තන්

ඒ අනුව සියළු වග උත්තරකරුවන්ට කිසිම මාර්ගයක් හරස් කර විරෝධතා හෝ ප්‍රචණ්ඩ ක්‍රියා නොකිරීමටත්, තවද කිසිම පාර්ලිමේන්තු වරප්‍රසාදයක් කිසිම අයෙකුට උල්ලංඝණය වන අයුරින් කිසිම උද්ඝෝෂණයක් සිදු කිරීම වහාම තහනම් කරමින්, මාර්ග හරස් නොවන අන්දමින් ප්‍රචණ්ඩත්වයකින් තොරව සහ කිසිම රථ වාහන ගමනා ගමනයකට කිසිම අවහිරයක් නොවන අන්දමින් පමණක් මෙම උද්ඝෝෂණය සිදුවන බවට සියළු වග උත්තරකරුවෝ අනිවාර්යෙන්ම වගබලා ගත යුතු බවට හා නොඑසේ නම් වහාම අදාල උද්ඝෝෂණය වග උත්තරකරුවන් විසින් නොපමාව විසුරුවා දැමිය යුතු බවත්, මෙම අණ කඩකල හොත් සාමය රකිනුවස් ශ්‍රී ලංකා පොලීසිය විසින් ඊට වහා පියවර ගතයුතු බවට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය මගින් ආඥාවක් නිකුත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**